## දේශීය ණය සහ සංවර්ධන අරමුදල
## පුරප්පාඩු

දිවයිනේ පළාත් පාලන ආයතන වල ප්‍රාග්ධන ආයෝජනය සහ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය ණය පහසුකම් සැපයීම සහ ණය ආපසු අයකිරීමේ ප්‍රධාන කාර්යභාරය ඉටුකරන දේශීය ණය සහ සංවර්ධන අරමුදල වර්ෂ 1916 අංක 22 දරණ ආඥා පනත යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාපිත ආයතනයක් වන අතර පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය යටතේ පාලනය වේ. මෙම ආයතනයේ පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### සංවර්ධන නිලධාරී (කොළඹ / කළුතර / ත්‍රිකුණාමලය / රත්නපුර දිස්ත්‍රික්ක සඳහා)
### පුරප්පාඩු සංඛ්‍යාව (තනතුරු 04 )

(01) **අධ්‍යාපන සුදුසුකම්** : විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක කලා/වාණිජ්‍ය/කළමනාකරණ උපාධියක් ලබා තිබීම.

(02) **අමතර සුදුසුකම්** :

(i) වරලත් ගණකාධිකාරී ආයතනයේ අන්තර්මධ්‍ය විභාගය හෝ ඊට සමාන පිළිගත් වෘත්තීය ගණකාධිකාරී ආයතනයක සුදුසුකම් සපුරා තිබීම.

සහ

(ii) ගණකාධිකරී ක්ෂේත්‍රයේ හෝ විගණන ක්ෂේත්‍රයේ වසරක (01) පළපුරුද්ද.

(iii) තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

(03)**වයස් සීමාව** : ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

(04)**වාර්ෂික වැටුප් පරිමාණය** : 32,200 – 10x445 – 11x 660 - 10x 730 - 05x750 – 54,960 (මාසික) (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2 / 2016, MA 3-2016 වැටුප් පරිමාණය අනුව 2018.01.01 දිනට මාසික වැටුප් පියවර රු. 25,560/- හා ගැලපුම් දීමනාව රු.3,160/- කි. (රජයේ අනුමත දීමනා එකතු වේ.)

## කළමනාකරණ සහකාර තනතුර - (ප්‍රධාන කාර්යාලය සඳහා)
## පුරප්පාඩු සංඛ්‍යාව (තනතුරු 04 )

**(01)** අධ්‍යාපන සුදුසුකම්

(අ) <u>බාහිර අයදුම්කරුවන්</u>

(අ) I. සිංහල / දෙමළ

II. ගණිතය

සහ

III. තව විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් හයකින් (06) අධ්‍යන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

සහ

(ආ) අධ්‍යන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේදී විෂයන් තුනකින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය) හැර සමත්ව තිබීම.

<u>වෙනත් සුදුසුකම්</u>

(අ) ගිණුම්කරණය පිළිබඳ සහතික පාඨමාලාවක් හෝ ඊට සමාන සුදුසුකම් සපුරා තිබීම. (ගණකාධිකරණය පිළිබඳ ප්‍රවීණතාවයක් ලබාතිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ)

(ආ) පිළිගත් ආයතනයක වසරකට නොඅඩු පරිගණක විෂය පිළිබඳ පාඨමාලාවක් (MS Office) සම්පූර්ණකර තිබීම.

(ආ) <u>අභ්‍යන්තර අයදුම්කරුවන්</u>

**සුදුසුකම්**

(අ) ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන, සහ ශිල්පීය සේවා ගණයන්හි පහත ආ, ඇ සහ ඉ සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම්කළ හැකිය.

(ආ) අ.පො.ස (සා.පෙළ) විභාගය එක් වරකදී පළමු භාෂාව හා ගණිතය යන විෂයයන් දෙක ඇතුළුව සම්මාන හතරක් සහිතව විෂයයන් 06 කට නොඅඩුව සමත් වී තිබිය යුතුය.

(ඇ) සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත්පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

**වෘත්තීය සුදුසුකම් :**

පිළිගත් ආයතනයක වසරකට නොඅඩු පරිගණක පිළිබඳව පාඨමාලාවක් සම්පූර්ණකර තිබීම (මෙම පාඨමාලාවට දැනට භාවිතයේ පවතින වදන් සැකසීම, පැතුරුම් පත, දත්ත සමුදාය සහ මෙහෙයුම් පද්ධතිය ඇතුලත් විය යුතුය)

**(02) වයස් සීමාව**

ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 30 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**(03) වැටුප් පරිමාණය**

27,910 – 10 x 300 – 7 x 350 – 4 x 495 – 20 x 660 – 48,540 (මාසික) (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක. 2 / 2016 , MA 1-1 -2016 වැටුප් පරිමාණය අනුව 2018.01.01 දිනට මාසික වැටුප් පියවර රු. 22,126/- හා ගැලපුම් දීමනාව රු.4,092/- කි. (රජයේ අනුමත දීමනා එකතු වේ.)

**සේවා කොන්දේසි**

i. මෙම තනතුරු ස්ථිර වන අතර වසර 03 ක පරිවාස කාලයකට යටත්වේ.

ii. සේවක අර්ථ සාධක අරමුදල සඳහා සේවකයා විසින් වැටුපෙන් 8% ක් ගෙවිය යුතු අතර සේව්‍යයා විසින් 12% ක් සහ 3% ක් සේවක භාරකාර අරමුදල සඳහා ද ගෙවනු ලැබේ.

iii. බඳවාගැනීම සම්මුඛ පරීක්ෂණයක් මගින් සිදුකෙරේ.

iv. රාජ්‍ය අංශයේ සේවය කරන නිලධාරීන් සිය අයදුම්පත්‍ර ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

අයදුම්පත් ප්‍රධාන විධායක නිලධාරී, දේශීය ණය සහ සංවර්ධන අරමුදල, අංක 24/ඒ, වෝර්ඩ් පෙදෙස, කොළඹ 07 යන ලිපිනයට 2018.04.27 දිනට හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පතේ ඉහළ කෙළවරේ අදාළ තනතුර හා අයදුම් කරනු ලබන දිස්ත්‍රික්කය සඳහන් කළ යුතුය.

එච්.ටී.කමල් පත්මසිරි
සභාපති
දේශීය ණය සහ සංවර්ධන අරමුදල